**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ

PEOPLE'S INSURANCE
EMPOWERING A RESILIENT NATION

# <u>මුදල් රක්ෂණ ඔප්පුව</u>

ඔප්පු වර්ගය: මුදල් රක්ෂණය

ලබා දෙනු ලබන මූලික ආවරණය:

1. ව්‍යාපාරය සම්බන්ධයෙන් සහ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්ථානවල සහ තත්ත්වයන් යටතේ රක්ෂිතයාට අයත් හෝ රක්ෂිතයා නීත්‍යානුකූලව වගකිව යුතු මුදල් අහිමි වීම, විනාශ වීම හෝ හානි වීමට එරෙහිව.

2. සොරකම හෝ සොරකම් කිරීමට තැත් කිරීමේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් උපලේඛනයේ දක්වා ඇති සේප්පුව (සේප්පු) සහ/හෝ ශක්තිමක් කාමර නැති වීම හෝ ඊට හානි සිදුවීම

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

<u>අමතර ආවරණ (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණය ලබා ගත හැකිය):</u>

1. වැඩවර්ජන කැරළි කෝලාහල සහ මහජන කැළඹීම් (SRCC) - *කරුණාකර පිටසන බලන්න - "SRCC පිටසන - SR 06"*
2. ත්‍රස්තවාදය - *කරුණාකර පිටසන බලන්න - "ත්‍රස්තවාදය පිළිබඳ පිටසන - TR 14"*
3. ද්‍රෝහිකම ආවරණය - මුදල් රැගෙන යාමේදී රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ සේවයේ නියුතු ඕනෑම පුද්ගලයකුගේ හෝ පුද්ගලයින්ගේ වංචාවකින් හෝ වංකභාවයකින් පැන නගින ද්‍රෝහිකම - *ඔප්පු වචනවල ව්‍යතිරේක අංක 01 මකා දැමීම*
4. ඔබගේ ඔප්පුවේ දක්වා ඇති වෙනත් ඕනෑම අමතර ආවරණයක්

<u>ප්‍රධාන ලක්ෂණය(යන්):</u>

1. මෙය සියලු අවදානම් ඔප්පුවක් වන අතර එය පහත ලැයිස්තු ගතකර ඇති ව්‍යතිරේක හැර රක්ෂිත දේපළවලට සිදුන ඕනෑම අලාභයක් හෝ හානියක් ආවරණය කරයි.

2. මුදල් යනු බැංකු සහ මුදල් නෝට්ටු, භාවිතයේ ඇති කාසි, චෙක්පත්, තැපැල් ඇණවුම්, මුදල් ඇණවුම්, වලංගු තැපැල් ගාස්තු සහ ආදායම් මුද්දර වේ.

*(ප්‍රධාන ලක්ෂණය(යන්) පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

<u>ආවරණය නොවන දේ (ව්‍යතිරේක):</u>

1. රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ සේවයේ නියුතු ඕනෑම පුද්ගලයකුගේ හෝ පුද්ගලයින්ගේ වංචාවක් නිසා හෝ වංකභාවයකින් පැන නගින අලාභ හෝ හානි (අතිරේක ආවරණයක් ලෙස ලබාගෙන නොමැති නම්)

2. පැහැදිලි කළ නොහැකි හිඟයක් හෝ දෝෂ හෝ අතපසුවීම් හේතුවෙන් ඇති හිඟතාවයන් හේතුවෙන්

3. වටිනාකම ක්ෂය වීම හේතුවෙන්

4. යුද්ධය

5. වැඩවර්ජන, කැරළි කෝලාහල, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදය (අතිරේක ආවරණයක් ලෙස ලබාගෙන නොමැති නම්)

6. අ) ඕනෑම න්‍යෂ්ටික ඉන්ධනයකින් හෝ ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයකින් ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමකින් හෝ න්‍යෂ්ටික ඉන්ධනයකින් ඇතිවන විකිරිණශීලීතා අයනීකරණය හෝ දූෂණය වීම

   ආ) ඕනෑම න්‍යෂ්ටික ස්ථාපනයක, ප්‍රතික්‍රියාකාරකයකින් හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ එහි න්‍යෂ්ටික සංරචකයක විකිරණශීලී, විෂ සහිත පපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකර හෝ දූෂිත අන්තර්ගතය

   ඇ) පරමාණුක හෝ න්‍යෂ්ටික විකණ්ඩනය සහ/හෝ විලයනය හෝ ඒ හා සමාන ප්‍රතික්‍රියාවක් හෝ විකිරණශීලී බලයක් හෝ පදාර්ථයක් භාවිතා කරන ඕනෑම යුද අවියක්

7. වාහනය තුල කිසිවෙක් නොසිටි අවස්ථාවේදී මුදල් අහිමි වීම

8. කිසියම් පුද්ගලයකුට තර්ජනය කිරීමෙන් හෝ ප්‍රචණ්ඩත්වය යොදා ලබාගෙන තිබුණහොත් මිස, රක්ෂිතයාට අයත් යතුරක් හෝ එහි අනු යතුරක් හෝ සංයෝජන කේතයක් භාවිතා කිරීමෙන් පසු සේප්පුවකින් හෝ ශක්තිමත් කාමරයකින් මුදල් නැති වීම

9. රාජසන්තක කිරීම, රඳවා තබා ගැනීම රජය විසින් හෝ පොදු අධිකාරියක් විසින් අත්පත් කර ගැනීම හෝ විනාශ කිරීම හේතුවෙන්

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 සහ 02, "ව්‍යතිරේක" යන කොටස බලන්න*

<u>වාරික ගෙවීමේ ක්‍රමය:</u>

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:</u>

1. වහාම පොලීසියට දැනුම් දෙන්න

2. මෙම රක්ෂණ ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්ෂිතයා 011 220 6306 යන දුරකථන අංකය ඔස්සේ රක්ෂණ සමාගමේ ඇමතුම් මධ්‍යස්ථානයට දැනුම් දිය යුතුය. අලාභය පිළිබඳ දැනගැනීමෙන් පසු ප්‍රමාදයකින් තොරව මෙසේ කළ යුතුය.

3. රක්ෂිතයා සිද්ධිය වී දින හතක් (07) ඇතුලත අලාභය හෝ හානිය නිශ්චිව දක්වමින් සවිස්තරාත්මක ලිඛිත හිමිකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 06 බලන්න*

<u>වංචාව:</u>

මෙම රක්ෂණ ඔප්පුව යටතේ ඇති ඕනෑම හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් වංචනික නම් හෝ රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ඕනෑම අයකු විසින් කිසියම් වංචනික ක්‍රමයක් හෝ උපාංගයක් භාවිතා කර ඇත්නම් හෝ හිතාමතාම කරන ලද ක්‍රියාවකින් හෝ රක්ෂිතයාගේ අනුදැනුම ඇතිව යම් විනාශයක්, තුවාලයක් හෝ හානියක් සිදුවුවහොත්, මෙම ඔප්පුව යටතේ ඇති සියලුම ප්‍රතිලාභ අහිමි වනු ඇත.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 08 බලන්න*

<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>

වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.
- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "කොන්දේසි" යන කොටස බලන්න*

හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම:-

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "කොන්දේසි" යන කොටස බලන්න*

- වාරික ගෙවීම:- ඔප්පුවේ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයට අනුව විය යුතුය.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරය" යන කොටස යටතේ කරුණු අංක 13 බලන්න*

- රක්ෂිතයා විසින් රක්ෂිතයාගේ පරිශ්‍රයේ මුදල් ප්‍රවාහනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මුදල් අඩංගු සේප්පුවේ හෝ ශක්තිමත් කාමරයේ හැර වෙනත් ආරක්ෂිත ස්ථානයක තබා ගත යුතුයි

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 02, "කොන්දේසි" යන කොටස බලන්න*

<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:-</u>

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකථනයෙන් - පාරිභෝගික සේවා නිලධාරී - 011 2126136
- ඊ-මේල් හරහා - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් හරහා - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය හරහා - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අප කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / වාහන අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

<u>ආරවුල් විසදීම:-</u>

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් (ADR) භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක 01, බෙතෙස්ඩා පෙදෙස,කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 04, "පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය" යන කොටස බලන්න*

<u>මතක තබා ගත යුතු කරුණු කිහිපයක්</u>

රක්ෂණය අවලංගු කිරීම:

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කළ හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03, "කොන්දේසි" යන කොටස යටතේ කරුණු අංක 12 බලන්න*

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිළිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

<u>වැදගත් සටහන්:</u>

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාළ වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාළ ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ ඉංග්‍රීසි මුද්‍රණයේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

වැඩිදුර තොරතුරු සඳහා:

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකථනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයක් වෙත පැමිණීමෙන්